## වාරියපොල ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දිනැතිව හා අර්ධ ශිල්පීය ගණයට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2009.05.12 දිනැතිව අනුමතකර ඇති බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක් ඇති ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 02. වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග) | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 04 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 03. පුස්තකාල උපස්ථායක | ප්‍රාථමික (ශිල්පීය නොවන) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 1 - 2016) රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 04. නළ ලිං පොම්ප කාර්මික | ප්‍රාථමික (අර්ධ ශිල්පීය) | III | 01 | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව (PL 2 2016) රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |

01. *කාර්යාල කර්ය සහායක, වැඩ/ක්ෂේත්‍ර කම්කරු(මාර්ග) හා පුස්තකාල උපස්ථායක තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :*

I. *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයය හැර)

II. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් සපුරා ඇති අය ව්‍යුහගත සම්මඛ පරීක්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් ලත් අය බඳවා ගනු ලැබේ.

III. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව තෝරාගනු ලැබේ. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

02. නළ ළිං පොම්ප කාර්මික තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්:

I. අධ්‍යාපන සුදුසුකම් :

*(අ)* බාහිර අයදුම්කරුවන් :

අ.පො. ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත් වී තිබිය යුතුය.(වෛකල්පිත විෂයය හැර)

*(ආ)* අභ්‍යන්තර අයදුම්කරුවන් :

පළාත් සභා රාජ්‍ය සේවයේ වාරියපොළ ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු (PL - 1 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජය විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

II. *ශිල්පීය නිපුණතා :*

රජය පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ තෘතිය ආයතනය විසින් පිළිගත් ආයතනයක නළ ළිං පොම්ප කාර්මික/නළ ළිං කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය (NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම)

III. *පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 2කට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

IV. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවය කරන අනියම්/ආදේශක/තාවකාලික සේවකයින් සඳහා ද, ස්ථිර සේවයේ නියුතු PL 1 වැටුප් ක්‍රමයට අදළ තනතුරු දරන අය සඳහා ද වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

V. *පොදු කොන්දේසි (සියලුම තනතුරු සඳහා)*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
5. වාරියපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරිගෙන් ලබා ගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකය අදළ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වාරියපොළ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

VI. ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අයෙක් හෝ අනියම්/ආදේශක/තාවකාලික සේවයේ යෙදී සිටින අයෙකුට නම් වයස් සීමාව බලනොපාන අතර, ඔහු/ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලැබීමක් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

VII. *අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :*

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2018.11.30 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, වාරියපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතිකය ;
3. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය (අර්ධ ශිල්පීය තනතුරු සඳහා);
4. ජාතික හැඳුනුම්පතෙහි පිටපත;
5. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;
6. නළ ළිං පොම්ප කාර්මිකවරයෙකු ලෙස සේවය කිරීමට අදාළව වසර 02කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

වයි. එම්. සේනානායක,<br>
ලේකම්,<br>
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2018 ඔක්තෝබර් මස 29 වැනි දින,<br>
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### වාරියපොල ප්‍රාදේශීය සභාවේ ............................................................. තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

01. මුලකුර සමග නම :....................................................................

මුලකුරුවලින් හැඳින්වෙන නම් :....................................................................

02. පෞද්ගලික ලිපිනය:....................................................................

03. උපන් දිනය ෑ අවුරුද්ද:.................. මාසය:.................. දිනය:..................

(අ) 2018.11.30 දිනට වයස අවු. :.................. මාස:.................. දින :..................

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:....................................................................

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචියෙන්ද ?:....................................................

06. ස්ත්‍රී/පුරුෂභාවය :....................................................................

07. විවාහක/අවිවාහක බව :....................................................................

08. සමත් ව ඇති ඉහළම විභාගය :....................................................................

09. ශිල්පීය නිපුණතා :....................................................................

10. වෘත්තීය සුදුසුකම් :....................................................................

11. ඔබට විරුද්ධව උසාවියකින් දඬුවම් පනවා තිබේද? :....................................................................

12. එසේ නම් දඬුවමේ ස්වභාවය :....................................................................

13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :................................................

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් , නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි.

..................<br>
අයදුම්කරුගේ අත්සන.

දිනය:..................

11-753